

# පීණී

## ජගත් ජේ එදිරිසිංහ

**3**

දින ගණනාවකින් අමන්දිට මෙන්ම නිමන්තට ද හරිහැටි නින්දක් නැත. සමහර රාත්‍රි කාල වලදී ඇය වේදනාවෙන් කෙඳිරිගානු නිමන්තට ඇසෙයි. ඒ වේලාවල දී ඇගෙන් ඒ ගැන විමසීම පවා ඇය කෝපයට පත්කරවන්නක් බවට පත්ව ඇති බැවින් එය නෑසුණා සේ සිටින්නට ඔහු උත්සාහ කළේ ය. නැගිට ගොස් ඇයට උපකාරයක් කරන්නට සිත බල කල ද ඔහු ආයාසයෙන් එය එය මැඩ පවත්වා ගතතේ ය.

අමන්දි දිනපතා පන්සල ට යාමට පටන් ගැනීම නිමන්ත ගේ සිතට සහනයක් ගෙන දුන්නේ ය. සෑම උදයකම නිමන්තට කලින් අවදි වන අමන්දි නිවසින් පිටව යාමට පුරුදු වූවා ය.

වෛද්‍ය ප්‍රතිකාර සඳහා ඇය රැගෙන යන සෑම දිනකම පවා නිහඬව ම වාහනයේ වාඩි වී සිටින ඈ නිමන්ත හා කතා බහ අඩු කළා ය. නිමන්ත අසන පැනයකට පවා ඇගෙන් පිළිතුරු ලෙස ලැබුණේ නිහඬතාව පමණකි. විටෙක මේ සියල්ල උපේක්ෂාවෙන් විඳ ගන්නට ඔහු උත්සාහ කළ ද ඇය පිළිබඳ සියුම් නොරිස්සුමක් ද සිය සිත කොණක උපදිමින් සිටින බව ඔහුට දැන් දැන් දැනෙයි.

"කතා නොකර ඉන්න එපා.. ඒක හරිම වදයක්..." ඔහු කීප වතාවක් ම කීවේ එනිසා ය. එය ඇය තේරුම් ගනු ඇතැයි ඔහු බලාපොරොත්තු වුව ද එවැනි තේරුම් ගැනීමක් ඈ වෙතින් දිස් නොවී ය. ඇය ඕනෑකමින් නොතේරුණා සේ සිටින්නේ යයි ඔහු අනුමාන කළේ ය.

"හැම දෙයක්ම තනියම විඳගන්න හදන්න එපා.. මාත් ඔයා එක්ක ඉන්න බව ඇයි අමතක කරන්න හදන්නෙ..?" නිමන්ත කීප වතාවක්ම ඇසූ නමුදු ඇය ඒ ගැන කිසිදු අදහසක් ඉදිරිපක් නොකළා පමණක් නොව ඔහුගේ ඒ ඉල්ලීම පවා දැඩිව නොසළකා හැරියා ය.

බොහෝ විට ඇගේ මුවින් පිට වූයේ එකම ඉල්ලීමකි.

"මට මගේ පාඩුවේ ඉන්න දෙන්න.."

සිය ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වී යන බව නිමන්තට දැන් වැටහෙයි. ඊයේ යනු හුදු සිහිනයක්ම පමණි. අද දවස සිතක් නැති එකකු සේ ගෙවිය යුතු ය. හෙට උදාවන්නේ කිසිදු ලෙසකින් නොපැතූ අමුතුම දවසකි. ඒ දවසට කෙසේ මුහුණ දෙන්නදැයි නිමන්තට නොවැටහෙයි.

අමන්දි දැඩි සිතින් නිමන්ත වෙතින් ඈත් වෙමින් සිටියා ය. මුල දී ඇයට එය ඉතා අපහසු කාර්යයක් විය. නිමන්ත හා ගත කළ සුන්දර යුගය කෙසේ නම් එක වර සිතින් අමතක කරන්න ද.? ඔහු හා ආ ගිය තැන්, ඔහු හා දෙඩූ වදන් පිළිබඳ මතකය වරින් වර සිත මතුපිටට විත් වද දෙයි.

"මගේ ජීවිතේ මට වුණ සුන්දරම දේ තමයි ඔයා හමුවීම.. ඒ සුන්දර අත්දැකීමෙන් මං වින්ද සතුට කිසිමදාක මේ ලෝකෙ කිසිම කෙනෙක් කවදාවත් විඳලා නැතුව ඇති.. කවදාවත් මගෙන් ඈත් වෙන්න එපා අමා.." නිමන්ත වරක් කී සැටි ඇයට සිහිපත් වෙයි. එදින ඔවුන් සිටියේ නකල්ස් කඳු වැටියේ ඝණ හරිත තුරු ලතාවෙන් වට වුණ අපූරු සුන්දර නවාතැනක බව ඇයට හොඳින් මතකය.

ඒ සිසිල් පරිසරයේදී ඔහුගේ උනුසුම කෙතරම් සුවදායක වීද..? ඔහු මෘදු ලෙස සිය දෙතොල් සිප ගන්නා විට සියොළඟ කිළිපොලා යන සංවේදනයෙන් කම්පිතව තව තවත් ඔහුට තුරුළු වූ හැටි කෙසේ අමතක කරන්න ද..? අමන්දි දිග සුසුමක් හෙළුවා ය. මතක සිත්තම් මකා දමන්නට සුසුමකට හැකිවේද?




"මට සමාවෙන්න නිමන්ත.. ජීවිතේ හැම දේම වෙනස් වෙලා.. මාත් වෙනස් වෙන්න ඕනෙ.." ඕ සිතුවා ය.

අලුත් දෛනික කාලසටහනකට අනුගත වන්නට අමන්දි උත්සාහ කළා ය. කාලය ගත කරන්නට පන්සල් බිමත් කලාගාරත් ඇයට මහත් උපකාරයක් විය. කලා භවනේත් පුද්ගලික කලා ගාර වලත් පැවති සෑම ප්‍රදර්ශනයකටම අමා නොවරදවා ගියා ය, පැය ගණන් ඒ නිර්මාණ අතර ගත කළා ය. තමා මිය යමින් සිටින්නේ ය යන සිතිවිල්ල ඒ කාලය තුළ ඇයට අමතක විය. එය යම්කිසි ස්වයං මෝහනයක් සේ ඇයට වරෙක දැනුණි. එනමුදු ආත්ම දමනය උදෙසා ඒ මෝහනයට නතු වන්නට ඇය බොහෝ කැමැත්තෙන් සිටියා ය.

සිතුවමක වර්ණ රටා තුළ සැඟවගත් අපූර්වත්වය විඳින්නට, සියුම් රේඛාවක රිද්මය වටහා ගන්නට, අමන්දි මහත් වෙහෙස වූවා ය. වෙහෙස වන්නට වන්නට ඒ කෙරෙහි වූ ඇල්ම තව තවත් වැඩි වනුද ඇයට දැනුණි.
කලක සිට යටපත්ව තිබූ ඒ කැමැත්තට ඉඩ දෙන්නට අමන්දි සිතා ගත්තා ය.

අමන්දි තෙල් සායම් පින්සල් සහ කැන්වස් තොගයක් මිලට ගත්තාය. නිවසේ කාමරයක් ඈ සිය කලාගාරය ලෙස වෙන් කරගත්තා ය. කාමරයේ ජනේලය අසළම ඊසලය සිටුවා ගත්තා ය. ඒ මත කැන්වසයක් රඳවා අඳින්නට ගත්තා ය. ඇය බොහෝ ප්‍රබෝධමත්ව සිටිණු නිමන්ත දුටුවේ ය. එය ඔහුගේ සිතට ද සතුටක් ගෙන දුන්නේ ය.

මුලුතැන් ගෙයට ගොස් තේ කෝප්පයක් සෑදූ ඔහු එය අමන්දි ඉදිරියේ වූ ටීපෝව මත තැබුවේ ය.

"බොන්න.." ඔහු කිවේ ය.

ඕ ඔහු දෙස බලා සිනාසුණා ය. බොහෝ දිනකට පසු ඔහු දුටු ඇගේ ඒ සිනාව ඔහු සිත මහත් සතුටකින් පුරවාලූයේ ය.

"හරිම අසාර්ථකයි.. අඳින්න ට්‍රයි කළා ට මට ඒ හැටි අඳින්න බැහැ වගේ.." ඕ කීවා ය.

"අතහරින්න එපා.. ඔයා ඉස්සර ලස්සනට ඇන්දෙ... ඔයාට පුලුවන්.. ට්‍රයි කරන්න.." ඔහු කීවේ ඇය දිරිමත් කරන්නට ය. ".. මතකද ඔයා එක සැරයක් මගේ පින්තූරෙ ඇඳලා එව්වා..?"

"ඇත්තටම මට ඒකාලෙ ටිකක් අඳින්න පුලුවන්.. දැන් හුරු නැහැ වගේ.. ඒ කාලෙ වගේ දැන් ඇඟිලි නම්‍යශීලි නැහැ වගේ.. මට ඕනෙ දේ ඇඳෙන්නෙ නැහැ.. අනික ඒ කාලෙ වගේ කුරුටු රූප අඳින්න නෙවෙයි මට දැන් ඕනෙ.. මම දැන් කැමති පේන්ටින්ග්ස් වලට.. ඊයෙ කලාභවනේ තිබ්බ ප්‍රදර්ශණේ පුදුම ලස්සන පේන්ටින්ග්ස් වගයක් තිබුණා.. ඒව දිහා බලා ඉන්නකොට මට දැනුණෙ මං වෙනම ලෝකෙකට ගියා වගෙයි.. ඒ ආටිස්ට් පුදුම දක්ෂ විදිහට ආලෝකයත් අඳුරත් පාවිච්චි කරලා තිබුණා... ඒ චිත්‍ර මට දැනෙන්නෙ කතා කරනවා වගේ.. වචන වලට පෙරළන්න බැරි මහා විශාල කතාන්දර ඒ චිත්‍ර ඇතුළෙ හැංගිලා තියෙනවා මට දැනුණා.. මට ඕනෙ අන්න ඒ වගේ පේන්ටින්ග්ස් කරන්න.." ඇගේ දෑස් කාන්තිමත්ව බැබලුණි. ඇගේ කටහඬ මහත් උද්යෝගයකින් දිදුලනු ඔහුට දැනුණි. ".. ඒ චිත්‍ර ඇඳලා තිබුණෙ විශ්වජිත් බණ්ඩාර.. ඔයා එයා ගැන අහල තියෙනවද..?"

නිමන්ත උරහිස් අකුලා සිනාසුණේ නැහැ යයි කියන්නටය.